# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

இலங்கை சனநாயக சோசலிசக்

குடியரசின் அரசாங்க சேவை

ஆணைக்குழு

**PUBLIC SERVICE COMMISSION**
**OF**
**THE DEMOCRATIC SOCIALIST REPUBLIC**
**OF SRI LANKA**

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# වාර්ෂික වාර්තාව
# 2019


1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

| | | |
|---|---|---|
| දුරකථන | - | 0112-136600 / 0112-136650 |
| ෆැක්ස් | - | 0112-876169 / 0112-876181 |
| ඊ මේල් | - | sec-psc@sltnet.lk / info@psc.gov.lk |
| වෙබ් | - | www.psc.gov.lk |

මගේ අංකය: PSC/ADM/07/02/2020
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 1200/9
රජමල්වත්ත පාර
බත්තරමුල්ල

2020 ජූලි මස 21 දින.


මහ ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි,

**2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා**
**කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී,



එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**දැක්ම**

ජාතියේ විශිෂ්ටත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්.

**මෙහෙවර**

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

## 2019.01.01 – 2019.12.31 කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

**සභාපති**

ඩී. දිසානායක මහතා

**සාමාජිකයින්**

ආචාර්ය පී. රාමනුජම් මහතා

වී. ජෙගරාසසිංගම් මහත්මිය

එස්. රනුග්ගේ මහතා

ඩී.එල්. මෙන්ඩිස් මහතා

එස්.ඒ.සී.එස්.ඩබ්ලිව්. ජයතිලක මහතා

මහාචාර්ය ඒ.ජී. හුසයින් ඉස්මායිල් මහතා

සුධර්මා කරුණාරත්න මහත්මිය

අරුණ ශාන්ත ද සිල්වා මහතා

ඩී.එස්. විජයතිලක මහත්මිය (2019.04.30 දක්වා)

එස්.එන්. සෙනෙවිරත්න මහතා (2019.02.14 දක්වා)

## පටුන


| අනු අංකය | | කාරණය | පිටුව |
|---|---|---|---|
| 1 | හැඳින්වීම | | 01 |
| 2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | | 01 |
| 3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | | 02 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 04 |
| 4 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | | 04 |
| | 4.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දෙන අභියෝග හා ගැටළුවලට ලබා දී ඇති විසඳුම් | 05 |
| 5 | රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන් | | 06 |
| | 5.1 | ආයතන අංශය | 06 |
| | 5.1.1 | ආයතන අංශයෙහි කාර්ය භාරය | 07 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගතිය (2019.01.01 –2019.12.31) | 07 |
| | 5.2 | පත්කිරීම් අංශය | 10 |
| | 5.2.1 | පත්කිරීම් අංශයෙහි කාර්යභාරය | 10 |
| | 5.2.2 | පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2019.01.01 –2019.12.31) | 10 |
| | 5.3 | උසස්කිරීම් අංශය | 16 |
| | 5.3.1 | උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය | 16 |
| | 5.3.2 | උසස්කිරීම් අංශයේ ප්‍රගතිය (2019.01.01 –2019.12.31) | 17 |
| | 5.4 | විනය අංශය | 19 |
| | 5.4.1 | විනය අංශයෙහි කාර්යභාරය | 19 |
| | 5.4.2 | විනය අංශයේ ප්‍රගතිය (2019.01.01 –2019.12.31) | 21 |
| | 5.5 | අභියාචනා අංශය | 23 |
| | 5.5.1 | අභියාචනා අංශයේ කාර්යභාරය | 23 |
| | 5.5.2 | අභියාචනා අංශයේ ප්‍රගතිය (2019.01.01 –2019.12.31) | 24 |
| | 5.6 | පාලන අංශය | 24 |
| | 5.7 | මූල්‍ය අංශය | 25 |
| | 5.8 | අභ්‍යන්තර විගණන අංශය | 25 |
| 6 | අධ්‍යාපන සේවා කමිටුව | | 26 |
| | 6.1 | අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය | 26 |
| | 6.2 | අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය (2019.01.01 – 2019.12.31) | 26 |
| 7 | සෞඛ්‍ය සේවා කමිටුව | | 28 |
| | 7.1 | සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය | 28 |
| | .7.2 | සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය (2019.01.01 – 2019.12.31) | 28 |
| 8 | මුදල් ප්‍රතිපාදනය | | 31 |
| 9 | කාර්ය මණ්ඩලය | | 31 |
| | 9.1 | සංවිධාන සටහන | 31 |
| | 9.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 31 |
| | 9.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 32 |
| 10 | 2019 වර්ෂය තුළ එක්එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | | 32 |
| 11 | කොමිෂන් සභා රැස්වීම් | | 32 |
| 12 | අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම් | | 32 |
| 13 | ස්තූතිය | | 40 |
| | ඇමුණුම් | | 41-43 |
| | විගණනය කරන ලද මූල්‍ය වාර්තාව | | 44 |

## 01. හැඳින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2015.10.15 දින නව කොමිෂන් සභාව පත් කරන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2019 ජනවාරි 01 වන දින සිට 2019 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ මෙම වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මගින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. එමගින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදී.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරී බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදී. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සිට ඉහළ තනතුරු හැර) පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී. කොමිෂන් සභාව හෝ එමගින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ජින්න කොට නව පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වූහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම හා විනය පාලනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත් කෙරිණි.

වර්ෂ 2010දී , 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වූහ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිණ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධුර හෙබවූ අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් විය.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පැවරිණි.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්

කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂම හා විගණන කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ පොලිස් නිලධාරීන් හා විගණන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයෙන් ඉවත් කෙරිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වගන්තියෙහි විධිවිධාන පරිදි අධ්‍යාපන සේවා කමිටුව හා සෞඛ්‍ය සේවා කමිටුව පිහිටුවා ඇත.

### 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත්කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කරන ලද පොලිස් නිළධරයෙකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛන ගත නිලධරයෙකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයෙකු හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවාවලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006හි අර්ථ නිරූපනය කර ඇති (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) තෘතියික මට්ටමේ අධිශ්‍රේණියේ හා විශේෂ ශ්‍රේණියේ නිලධරයන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ද ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ සියලුම නිලධාරීන් ද සම්බන්ධ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පවරා ඇත. රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් සම්බන්ධව විනය පාලනය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හෝ අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරා ඇත.

අංක 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1989/29 හා 2016.10.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේත් බලතල අධ්‍යාපන සේවා කමිටුව වෙත පවරා ඇත. මෙම කමිටුවේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 ( 1 ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

අංක 1994/24 හා 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේත් බලතල සෞඛ්‍ය සේවා කමිටුව වෙත පවරා ඇත. මෙම කමිටුවේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 ( 1 ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.
මීට අමතරව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව සියලුම අධ්‍යාපන සේවා පිරිස් එනම්, ගුරුවරු, විදුහල්පතිවරු, සහ අධ්‍යාපන නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ජාතික සේවයට අයත් එහෙත් පළාත්බද අධිකාරියට ද්විතීයනය කිරීම මත සේවය කරන නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම ඇත. එමෙන්ම සේවයෙන් පහකිරීමට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිය පළාත්බද අධ්‍යාපන සේවාවට අයත් නිලධාරීන්ට ද ඇත.

එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදු කරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුවේ.

### 3 . 1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

### 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම, කුසලතාවය, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ සේවා ව්‍යවස්ථාවන් හා බඳවා ගැනීම් පටිපාටිවලට අනුගතව සාධාරණව හා අපක්ෂපාතීව බඳවා ගැනීමට කටයුතු කර ඇත. නිසිකලට විධිමත්ව බඳවා ගැනීම් සිදු කිරීමට හැකි වන පරිදි සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි සැකසීම මගින් රාජ්‍ය සේවයේ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන දැනුම හා කුසලතාවය හෙබි තරුණ පිරිසක් විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමට හැකියාව ලැබුණි.

I SO 9001 : 2008 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පිරිනමන I SO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා ඇති බැවින් තවදුරටත් තත්ත්ව කළමනාකරණ පද්ධතිය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් නිරන්තරයෙන් සිදු කිරීමටත්, හඳුන්වා දී ඇති කාල නිර්නායක හා වැඩ අදියර අනුව සාධාරණ කාල රාමු තුළ වඩාත් ක්‍රමවත්ව නිරවද්‍යව හා කඩිනම්ව කාර්යයන් නිම කිරීමටත් හැකියාව ලැබී ඇත. සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමෙන් හා කාර්යයන් සඳහා නිශ්චිත ඉලක්ක ලබා දීමෙන් කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය කර ඇත.

පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේද අමාත්‍යාංශ ලේකම්වරු හා පාලන කටයුතු භාර අතිරේක ලේකම්වරු කැඳවා පෙර වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග රාජකාරි කිරීමේදි මුහුණ දීමට සිදු වූ ගැටළු පිළිබඳ සමාලෝචනයක් කර කාර්යයන් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

නිශ්චිත කාල රාමුවක් තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග ලබා ගැනිමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට නිලධාරීන්ට ඉලක්ක ලබා දෙමින් ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හැකි විය පත්කිරීම් හා උසස්කිරීම්වලට අදාළ සියලු ලියවිලි සම්පූර්ණ කර එකවර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට උපදෙස් චක්‍රලේඛයන් නිකුත් කිරීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් ආකෘතිපත්‍ර, පිරික්සුම් ලැයිස්තු සම්බන්ධව නැවත දැනුවත් කිරීමත් තුළින් පත්කිරීම් හා උසස්කිරීම් සම්බන්ධ කටයුතු වඩාත් කාර්යක්ෂම කරගැනීමටත් හැකි වී ඇත.

අතිරේක ලේකම්. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා ප්‍රධාන ගණකාධිකාරී වැනි හා ඒ හා සමාන වෙනත් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන පත්කිරීම් හෝ එම තනතුරුවලින් නිලධාරීන් ඉවත් කිරීම් සිදුකර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමේදී ඇතිවන ගැටළුසහගත හා අහිතකර තත්ත්වයන් වළක්වාලීම සඳහා එවැනි පත්කිරීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමෙන් අදාළ පත්කිරීම් විධිමත් කළහැකි විය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා අගතියට පත්වන නිලධාරීන්ට සහන සැලසීම,වැඩ බැලීම, රාජකාරි ඉටු කිරීම සහ විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය විධිමත් කර ඊට අනුමැතිය ලබා දිය හැකි බලතල විමධ්‍යගත කිරීමෙන් අප්‍රමාදව අදාළ කටයුතු සිදුකිරීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේදී ඇතිවන ප්‍රමාදයන් අවම කර ගනිමින් සේවා අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්ට කඩිනම් සේවයක් සැලසීම සඳහා විධිමත්ව සිහිකැඳවීම් කරමින් හා ලිපි හුවමාරු අවම වන පරිදි සාකච්ඡා පැවැත්වීමෙන් කටයුතු කාර්යක්ෂමව කිරීමට පියවර ගන්නා ලදී.

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් වල උසස් කිරීම් සිදු කිරීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම් කුසලතාවය වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ උසස් කිරීමේ පටිපාටිවලට අනුගතව විනිවිදභාවයෙන් යුක්තව උසස් කිරීමට කටයුතු කර ඇත. අප්‍රමාදව උසස් කිරීම් සිදුකිරීම මගින් රාජ්‍ය නිලධාරීන් තුළ අභිප්‍රේරණය ඇති කිරීමෙන් ගුණාත්මක හා සඵලදායී රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට ක්‍රියා කර ඇත.

බලය අභිනියෝජිත බලධරයෙකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ යුක්තිගරුක, සාධාරණ හා අපක්ෂපාතී තීරණ ලබා දීම මගින් රාජ්‍ය නිලධරයන්ගේ අභියාචන අවස්ථා සුරක්ෂිත කිරීමටත් එම ගැටළු සඳහා පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ සාධාරණ හා අපක්ෂපාතී තීරණ ලබා දීමටත් සිදු කරන ලදී.

කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ සුභසාධනය සඳහා වාර්ෂික විනෝද චාරිකාව සහ නිලධාරීන්ගේ කලා හැකියාවන් ඔප් නැංවීමේ අරමුණින් පවත්වනු ලබන " ගී ගොනුව " ප්‍රසංගය වැනි වැඩසටහන් මෙම වර්ෂය තුළදීත් ඉතා සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබුණි.

## 4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළුවලට ලබා දී ඇති විසදුම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සැකසීම, පත්කිරීම්, උසස්කිරීම්, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විවිධාකාර රාජකාරිමය ගැටළු පැන නැගීම නිසා ඇති වන ප්‍රමාදයන් වැළැක්වීමට අදාළ ආයතන වල නිලධාරීන් සමග අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් පවත්වා විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඊට අමතරව කඩිනම් පිළිතුරු ගෙන්වා ගැනීම සඳහා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට සිහි කැඳවීම් යැවීමටද කටයුතු කර ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා අගතියට පත්වන නිලධාරීන්ට සහන සැලසීම, වැඩ බැලීම / රාජකාරි ඉටු කිරීම සහ විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටිය විධිමත් කර ඊට අනුමැතිය ලබා දිය හැකි බලතල විමධ්‍යගත කිරීමෙන් අදාළ කාර්යයන් අප්‍රමාදව සිදුකිරීමට හැකියාව ලැබිණ.

තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ සහ නියෝග වැඩ කරන දින 03ක් ඇතුළත වෙබ් අඩවියේ පළකිරීම තුළින් සේවාදායකයින්ට හැකි ඉක්මනින් එම තීරණ හෝ නියෝග සන්නිවේදනය කිරීමට කටයුතු සළස්වා ඇත.

එක් එක් අංශයන්හී ඇති කාර්යයන් විෂය භාර නිලධාරීන් අතර බෙදී යාමේ විෂමතාවයන් අවම කරමින් විෂය රාජකාරි නැවත පැවරීම තුලින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩිකර ගැනීමට කටයුතු කල අතර ඇතැම් අංශවල සේවය කළ කාන්තා නිලධාරිනියන් ප්‍රසූත

නිවාඩු ලබා ගැනීම නිසාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළ දීර්ඝ කාලයක් සේවය කළ අත්දැකීම් බහුල නිලධාරීන් ස්ථාන මාරු වීම නිසාත්, පැමිණි නවක නිලධාරීන්ට අත්දැකීම් ලබා ගැනීමට කාලයක් ගතවන නිසාත් ඔවුන් පුහුණු වීම් සඳහා සම්බන්ධ කිරීමෙන් හා ඔවුන්ගේ පසු විපරම් කටයුතු විධිමත් කිරීමෙන් අවශ්‍ය සේවාව කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු යොදන ලදී.

ඇතැම් සේවාවන්වලට අදාළ සේවා ව්‍යවස්ථාවන්හී පැවති ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කර ගනිමින් ඒ ඒ සේවාවල පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී. තවද, බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීමේදී ඒවායේ මෘදු පිටපත් ගෙන්වාගෙන අවශ්‍ය සංශෝධන සිදුකර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම සංශෝධිත මෘදු පිටපත් විද්‍යුත් තැපෑල මගින්ම අදාළ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කිරීම මගින් අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගනිමින් වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකියාව ලැබී ඇත.

තවද. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත මෙතෙක් පැවරී තිබූ රාජකාරිවලට අමතරව දෙපාර්තමේන්තුගත තනතුරුවලට අදාළ අන්තර්ග්‍රහණය සම්බන්ධ කටයුතු සහ හෙද. පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවලින් විශ්‍රාම ගත් නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සම්බන්ධ කටයුතු ද පවරා ඇති අතර සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව වුවද අදාළ රාජකාරි සියල්ලම ප්‍රමාදයකින් තොරව සිදුකිරීමට උපරිම වශයෙන් උත්සහ දරා ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් පුද්ගලයින් විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ලබා දෙන ක්‍රියාත්මක කල නොහැකි ඇතැම් තීරණ හා පවතින නීතිරීතිවලට අනුකූල නොවන තීරණ මෙන්ම ක්‍රියාත්මක කිරීමේදී සමස්ථ රාජ්‍ය සේවය තුළම බරපතල විෂමතා සිදු කෙරෙන තීරණ නිසා ගැටළුකාරී තත්ත්වයන් ඇතිවීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මුහුණදෙන එක් බාධකයක් ලෙස දැක්විය හැක.

කෙසේ වෙතත් 2019 වර්ෂය තුළ ඉටු කරන ලද සමස්ථ කාර්යයන් සම්බන්ධව සැළකීමේදී අභියෝග අවස්ථාවක් කර ගනිමින් හා ගැටළු පැහැදිලිව විශ්ලේෂණය කර ඒවා නිරාකරණය කර ගනිමින් කාර්ය මණ්ඩලයේ කැපවීමත් අන්‍යෝන්‍ය සහයෝගයත් මත රාජ්‍ය සේවයේ සාර්ථකත්වය කරා ගමන් කිරීමට හැකියාව ලද වසරකි.

## 05. රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් අංශය
- උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 5.1 ආයතන අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදු කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක්ද,

එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක්ද සකස් කිරීම ආයතන අංශය මගින් සිදු කරයි.

එම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමේදී, අනුමත සෑම තනතුරකටම නිලධාරීන් බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමය, බඳවා ගැනීමේ සුදුසුකම්, තනතුරට අදාළ වැටුප් පරිමාණය, සේවා නියමයන් හා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ අනෙකුත් සියලු විස්තර ඇතුළත් කිරීම සිදු කරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් ගේ නිර්දේශයද ලබා ගනී.

### 5. 1. 1 ආයතන අංශයෙහි කාර්යභාරය


- රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුතු.
- එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමේ කටයුතු
- උසස්කිරීමේ පටිපාටි සැකසීමේ කටයුතු
- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීමේ කටයුතු
- සියලුම සේවාවන් සඳහා ස්ථාන මාරු පටිපාටි සකස් කිරීමේ කටයුතු
- අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවා ගැනීමේ පටිපාටියක් හෝ ස්ථාන මාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කර අනුමත කිරීමේ කටයුතු
- බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස් කිරීම්වලට අදාළව පැන නගින ගැටළුවලට විසඳුම් ලබා ගැනිම සඳහා එවනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබා දීමේ කටයුතු
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ස්ථාන මාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝග වලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටළුවලට විසඳුම් ලබා දීමේ කටයුතු
- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

### 5. 1. 2 ආයතන අංශයේ ප්‍රගතිය ( 2019.01.01 – 2019.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | බඳවාගැනීමේ පටිපාටි | 52 |
| 02 | සේවා ව්‍යවස්ථා | 02 |
| 03 | ස්ථාන මාරු පටිපාටි | 06 |
| 04 | උසස්කිරීම් පටිපාටි | 19 |
| 05 | බඳවාගැනීමේ පටිපාටි සංශෝධන | 80 |
| 06 | සේවා ව්‍යවස්ථා සංශෝධන | 28 |
| 07 | ස්ථානමාරු පටිපාටි සංශෝධන | 09 |
| 08 | උසස්කිරීම් පටිපාටි සංශෝධන | 05 |
| 09 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 139 |
| 10 | පොදු කරුණු | 125 |
| 11 | විශේෂ අවස්ථාවන්හිදි සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 02 |

| | | |
|---|---|---|
| 12 | විශේෂ අවස්ථාවන්හිදී බඳවාගැනීමේ පටිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 25 |
| 13 | පරිපාලන බලතල පැවරීම | 17 |
| 14 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරිය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 15 |
| 15 | චක්‍රලේඛ | 04 |
| | එකතුව | 528 |

**වගුව අංක 01**




**රූපසටහන අංක 01**

### 2019.01.01 සිට 2019.12.31 දක්වා අනුමත කරන ලද
### බඳවාගැනීමේ පටිපාටි පිළිබඳ විස්තර

| අනු අංකය | අමාත්‍යාංශය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන | 03 |
| 2 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 06 |
| 3 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන | 13 |
| 4 | ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් | 01 |
| 5 | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 02 |
| 6 | කාන්තා හා ළමා කටයුතු සහ වියළි කළාප සංවර්ධන | 01 |
| 7 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු. නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු | 01 |
| 8 | නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු | 02 |
| 9 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 02 |

| | | |
|---|---|---|
| 10 | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් | 05 |
| 11 | මහවැලි සංවර්ධන හා පරිසර | 01 |
| 12 | මුදල් හා ජනමාධ්‍ය | 02 |
| 13 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ | 02 |
| 14 | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන | 01 |
| 15 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ | 01 |
| 16 | විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා | 01 |
| 17 | විදේශ කටයුතු | 01 |
| 18 | සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු | 01 |
| 19 | සමාජ සුභ සාධන හා ප්‍රාථමික කර්මාන්ත | 01 |
| 20 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 02 |
| 21 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 01 |
| 22 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| 23 | මුදල් කොමිෂන් සභාව | 01 |
| | එකතුව | 52 |

**වගුව අංක 02**

**2019.01.01 සිට 2019.12.31 දක්වා අනුමත කරන ලද**

**උසස්කිරීමේ පටිපාටි පිළිබඳ විස්තර**

| අනු අංකය | අමාත්‍යාංශය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන | 02 |
| 02 | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් | 09 |
| 03 | මුදල් හා ජනමාධ්‍ය | 01 |
| 04 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 03 |
| 05 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු | 01 |
| 06 | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 02 |
| | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ | 01 |
| | **එකතුව** | **19** |

**වගුව අංක 03**

**<u>2019 වර්ෂයේ අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටි - (11)</u>**

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරු පටිපාටිය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන් සහ සමාන්තර සේවාවන්හී ස්ථාන මාරු පටිපාටිය
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය සඳහාවන ස්ථාන මාරු පටිපාටිය
4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II,III ශ්‍රේණිය සඳහාවන ස්ථාන මාරු පටිපාටිය
5. ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන තාක්ෂණ සහායක III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
6. ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

**<u>2019.01.01 සිට 2019.12.31 දක්වා අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා පිළිබඳ විස්තර</u>**

1. ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව
2. ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාව

**2019 වර්ෂයට අදාළව නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - (04)**

1. 01/2019 ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකදී අනුගමනය කලයුතු ක්‍රියාපිළිවෙල
2. 02/2019 නීති නිලධාරී තනතුර සඳහාවන අනුමත බඳවා ගැනීමහ් පටිපාටිවලබඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීම
3. 01/2019(1) ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකදී අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙල
4. 04/2019 රජයේ සේවයෙන් පරිබාහිර තනතුරක් සඳහා මුදාහැරීමේ සේවා කාලය සම්බන්ධව

**5.2 පත්කිරීම් අංශය**

අංක 1955/22 හා 2016.02.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තා වූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/7 හා 2016.11.07 යන අති විශේෂ ගැසට් පත්‍රයන්හී පළකරනු ලැබ ඇත්තා වූද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

**5.2.1 පත්කිරීම් අංශයෙහි කාර්යභාරය**

අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලීමේ/රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීමට ආවරණ අනුමැතිය ලබා ගැනීම, මුදාහැරීම (ස්ථිර/තාවකාලික), කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම හැර), විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.


ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

**5.2.2. පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2019.01.01 – 2019.12.31)**

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් (වි.වැ. ව්‍ය. සංග්‍රහයේ 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම් හැර) | 11 |
| 2 | ස්ථිර කිරීම් | 565 |
| 3 | බඳවා ගැනීම් | 832 |
| 4 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | 923 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | 101 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 924 |
| 7 | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත්කිරීම් | 1124 |

| | | |
|---|---|---|
| 8 | මුදාහැරීම් | 102 |
| 9 | ඉල්ලා අස්වීම් | 23 |
| 10 | අන්තර්ග්‍රහණය කිරීම් | 1801 |
| 11 | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අදාළ ඉල්ලීම්වලට ලබාදුන් පිළිතුරු | 93 |
| | එකතුව | 6499 |

**වගුව අංක 04**




**රූපසටහන අංක 02**

| අනු අංකය | විශ්‍රාම ගැන්වීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේතුව | 01 |
| 02 | ඉඩම් අමාත්‍යාංශය | 03 |
| 03 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 04 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 05 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් අමාත්‍යාංශය | 01 |
| 06 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 07 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 01 |
| | **එකතුව** | **10** |

**වගුව අංක 05**

| අනු අංකය | ස්ථිර කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|

| | | |
|---|---|---|
| 01 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 02 |
| 03 | අභ්‍යන්තර කටයුතු, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 04 | ඉඩම් අමාත්‍යාංශය | 02 |
| 05 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 05 |
| 06 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 19 |
| 07 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 03 |
| 08 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 09 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 01 |
| 10 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 05 |
| 11 | වරාය හා නාවික, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 04 |
| 12 | ශ්‍රී ලංකා විදේශ සේවය | 01 |
| 13 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 02 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 02 |
| 15 | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවය | 7 |
| 16 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 86 |
| 17 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 13 |
| 18 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 68 |
| 19 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | 01 |
| 20 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 05 |
| 21 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 151 |
| 22 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 88 |
| 23 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 20 |
| 24 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය | 07 |
| 25 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 69 |
| 26 | ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවය | 01 |
| | එකතුව | 565 |

**වගුව අංක 06**

| අනු අංකය | බඳවා ගැනීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | තක්සේරු දෙපාර්තමේන්තුව | 01 |
| 2 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 3 | නීතිපති දෙපාර්තමේන්තුව | 05 |
| 4 | වාර්මාර්ග දෙපාර්තමේන්තුව | 01 |
| 5 | ඉඩම් අමාත්‍යාංශය | 02 |
| 6 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 01 |
| 7 | මුද්‍රණ දෙපාර්තමේන්තුව | 05 |
| 8 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 07 |
| 9 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 10 | බුද්ධශාසන අමාත්‍යාංශය | 01 |
| 11 | සංචාරක හා වනජීවී අමාත්‍යාංශය | 01 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 01 |
| 13 | බලශක්ති හා පුනර්ජනනීය අමාත්‍යාංශය | 01 |
| 14 | ප්‍රජා මූලික නිවැරදිකිරීම් දෙපාර්තමේන්තුව | 02 |
| 15 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 01 |
| 16 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 16 |
| 17 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 18 | වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව | 01 |
| 19 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 01 |
| 20 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 21 | ශ්‍රී ලංකා විදුහල්පති සේවය (අධ්‍යාපන සේවා කමිටුව යොමුකල අභියාචනා මත | 01 |

| | | |
|---|---|---|
| 22 | ශ්‍රී ලංකා රේගු සේවය | 31 |
| 23 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 34 |
| 24 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 109 |
| 25 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය | 05 |
| 26 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 264 |
| 27 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 182 |
| 28 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 65 |
| 29 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 01 |
| 30 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 23 |
| 31 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 48 |
| 32 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 01 |
| 33 | රජයේ අධිනීතිඥ | 01 |
| 34 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 16 |
| | **එකතුව** | **832** |

වගුව අංක 07

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 02 | අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| 03 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 02 |
| 04 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 204 |
| 05 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 40 |
| 06 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 05 |
| 07 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 01 |
| 08 | ජනාධිපති කාර්යාලය | 01 |
| 09 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 01 |
| 10 | ආරක්ෂක අමාත්‍යාංශය | 19 |
| 11 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 03 |
| 12 | නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 10 |
| 13 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 98 |
| 14 | තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය | 07 |
| 15 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 16 | ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 17 | ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 429 |
| 18 | නගර සැලසුම්. ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 08 |
| 19 | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | 04 |
| 20 | ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය | 19 |
| 21 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය | 01 |
| 22 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 64 |
| 23 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 03 |
| | **එකතුව** | **923** |

වගුව අංක 08

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 2 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 10 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 09 |
| 4 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 5 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 20 |
| 6 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 02 |
| 7 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 8 | ධීවර කටයුතු දෙපාර්තමේන්තුව | 25 |
| 9 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 16 |

| | | |
|---|---|---|
| 10 | නගර සැලසුම් හා ජලසම්පාදන දෙපාර්තමේන්තුව | 16 |
| | එකතුව | 101 |

**වගුව අංක 09**

| අනු අංකය | මුදා හැරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 02 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 03 | නිවාස, ඉදි කිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 04 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 02 |
| 05 | ඉඩම් අමාත්‍යාංශය | 05 |
| 06 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 |
| 07 | ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය | 01 |
| 08 | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 01 |
| 09 | ජනමාධ්‍ය අමාත්‍යාංශය | 01 |
| 10 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 03 |
| 11 | මුදල් අමාත්‍යාංශය | 01 |
| 12 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 65 |
| 13 | විමර්ශණ කොමිෂන් සභාව | 01 |
| 14 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 03 |
| 15 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 01 |
| 16 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 17 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 18 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 02 |
| 19 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 01 |
| 20 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 02 |
| 21 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 03 |
| | එකතුව | 102 |

**වගුව අංක 10**

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධිකරණ අමාත්‍යාංශය | 01 |
| 02 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 03 | ඉඩම් අමාත්‍යාංශය | 05 |
| 04 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 15 |
| 05 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 15 |
| 06 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 07 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 22 |
| 08 | විද්‍ය. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 01 |
| 09 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 10 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 05 |
| 11 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 56 |
| 12 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 11 |
| 13 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන. නැවත පදිංචිකිරීම් | 08 |
| 14 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 14 |
| 15 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 16 | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවය | 08 |

| | | |
|---|---|---|
| 17 | රේගු දෙපාර්තමේන්තුව | 16 |
| 18 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 19 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 01 |
| 20 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 27 |
| 21 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 21 |
| 22 | සංවර්ධන නිලධාරී සේවය | 01 |
| 23 | ශ්‍රී ලංකා විගණන සේවය | 01 |
| 24 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 499 |
| 25 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 31 |
| 26 | කාර්යාල සේවක සේවය | 72 |
| 27 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 12 |
| 28 | ඒකාබද්ධ රියදුරු සේවය | 04 |
| 29 | බලයලත් නිලධාරී ආගමන විගමන දෙපාර්තමේන්තුව | 21 |
| 30 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 03 |
| 31 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 01 |
| 32 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 13 |
| 33 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 07 |
| 34 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 17 |
| 35 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | 03 |
| 36 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |
| 37 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 01 |
| 38 | ග්‍රාම නිලධාරී සේවය | 04 |
| | එකතුව | 924 |

වගුව අංක 11

| අනු අංකය | වැඩ බැලීමට / රාජකාරී ඉටු කිරීමට පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 01 |
| 02 | දිස්ත්‍රික් ලේකම් | 38 |
| 03 | අධ්‍යාපන අමාත්‍යාංශය | 02 |
| 04 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 12 |
| 05 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 683 |
| 06 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10 |
| 07 | ජාතික ඒකාබද්ධතා රාජ්‍ය භාෂා සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 08 | ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය | 04 |
| 09 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 13 |
| 10 | ඉඩම් අමාත්‍යාංශය | 11 |
| 11 | සංචාරක සංවර්ධන. වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 12 | ආරක්ෂක අමාත්‍යාංශය | 04 |
| 13 | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 69 |
| 14 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 15 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 31 |
| 16 | තැපැල්. තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 25 |
| 17 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 18 |
| 18 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 03 |
| 19 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 03 |
| 20 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 01 |
| 21 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 22 | විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය | 05 |
| 23 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 01 |
| 24 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 03 |
| 25 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 168 |
| 26 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 04 |
| 27 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 28 | විද්‍යා. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 01 |
| 29 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 05 |

| | | |
|---|---|---|
| | **එකතුව** | **1124** |

වගුව අංක 12

| **අනු අංකය** | **ඉල්ලා අස්වීම්** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 02 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 02 |
| 03 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 |
| 04 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 04 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවය | 01 |
| 07 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 01 |
| 08 | ඉඩම් අමාත්‍යාංශය | 01 |
| 09 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 07 |
| 10 | මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 11 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 02 |
| | **එකතුව** | **23** |

වගුව අංක 13

| **අනු අංකය** | **අන්තර්ග්‍රහණය කිරීම්** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 |
| 02 | සමෘද්ධි දෙපාර්තමේන්තුව | 1125 |
| 03 | පොදු ව්‍යවසායක දෙපාර්තමේන්තුව | 01 |
| 04 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 05 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 623 |
| 06 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 02 |
| 07 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 47 |
| | **එකතුව** | **1801** |

වගුව අංක 14

### 5.3 උසස් කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තාවූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබ ඇත්තා වූද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් පහත කාර්යභාරය යටතේ දක්වා ඇති කර්තව්‍යයන් උසස් කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.


#### 5.3.1 උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය

අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීම් පටිපාටි/ උසස් කිරීම් පටිපාටි අනුව උසස් කිරීම් මෙන්ම ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තරඟකාරී විභාග. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින් තෝරා ගැනීම් මත සිදු කරනු ලබන උසස්කිරීම්, ජ්‍යෙෂ්ඨතාවය මත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත මෙන්ම උසස්කිරීම් මත නිලධාරීන් අදාළ තනතුරුවලට පත්කිරීම, දීප ව්‍යාප්ත සේවාවන්හී 1 ශ්‍රේණියේ හා ඉන් ඉහල ශ්‍රේණිවල නිලධාරීන් තනතුරකින් තනතුරකට ස්ථාන මාරු කිරීමේදී ඊට පූර්ව අනුමැතිය ලබා දී අදාළ නව තනතුරට පත්කිරීම, ප්‍රාදේශීය ලේකම් තනතුරට පත්කිරීම් (ස්ථිරව/ වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට), මාණ්ඩලික නිලධාරීන්ගේ උසස්කිරීම්වලට අදාළව සෞඛ්‍ය සේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් ලබා දී ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම උසස්කිරීම් අංශයේ කාර්යභාරය වේ.

### 5.3.2 උසස් කිරීම් අංශයේ ප්‍රගතිය (2019.01.01 - 2019.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 550 |
| 2 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 1084 |
| 3 | තනතුරුවලට පත්කිරීම් | 528 |
| 4 | වැඩ බැලීමට, රාජකාරි ඉටු කිරීමට පත්කිරීම්(ප්‍රාදේශීය ලේකම්) | 81 |
| 5 | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අදාළ ඉල්ලීම්වලට ලබාදුන් පිළිතුරු | 72 |
| | එකතුව | 2315 |

වගුව අංක 15




රූප සටහන අංක 03

| අනු අංකය | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 24 |
| 02 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 03 |
| 03 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 18 |
| 04 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 108 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 159 |
| 06 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 29 |
| 07 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය | 07 |

| | | |
|---|---|---|
| 08 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 01 |
| 09 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 21 |
| 10 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 62 |
| 11 | ශ්‍රී ලංකා රේගු සේවය | 13 |
| 12 | ශ්‍රී ලංකා විදේශ සේවය | 04 |
| 13 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 33 |
| 14 | ශ්‍රී ලංකා සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය සේවය | 55 |
| 15 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 03 |
| 16 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 01 |
| 17 | ඉඩම් ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| 18 | තැපැල් දෙපාර්තමේන්තුව | 02 |
| 19 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 05 |
| 20 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 |
| | **එකතුව** | **550** |

**වගුව අංක 16**

| අනු අංකය | තෝරාගැනීම් මත උසස්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 20 |
| 02 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 03 |
| 03 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 10 |
| 04 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 33 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 81 |
| 06 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 94 |
| 07 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 16 |
| 08 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 14 |
| 09 | ශ්‍රී ලංකා විදේශ සේවය | 01 |
| 10 | කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණිය | 275 |
| 11 | ශ්‍රී ලංකා සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය සේවය | 01 |
| 12 | ග්‍රාම නිලධාරී | 67 |
| 13 | බලයලත් නිලධාරී | 01 |
| 14 | අල්ලස් දූෂණ විමර්ශන කොමිෂන් සභාව | 02 |
| 15 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 11 |
| 16 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 210 |
| 17 | සුරාබදු දෙපාර්තමේන්තුව | 11 |
| 18 | රේගු දෙපාර්තමේන්තුව | 126 |
| 19 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 05 |
| 20 | නීතිපති දෙපාර්තමේන්තුව | 13 |
| 21 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 01 |
| 22 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 23 | තක්සේරු දෙපාර්තමේන්තුව | 5 |
| 24 | තැපැල් දෙපාර්තමේන්තුව | 83 |
| | **එකතුව** | **1084** |

**වගුව අංක 17**

| අනු අංකය | තනතුරුවලට පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 02 | මුදල් අමාත්‍යාංශය | 01 |
| 03 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 |
| 04 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 05 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 04 |
| 06 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | 02 |

| | | |
|---|---|---|
| 07 | සුරාබදු දෙපාර්තමේන්තුව | 01 |
| 08 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 01 |
| 09 | විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 02 |
| 10 | අපනයන පාලන දෙපාර්තමේන්තුව | 01 |
| 11 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 03 |
| 12 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 28 |
| 13 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 19 |
| 14 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 98 |
| 15 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 01 |
| 16 | ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 08 |
| 17 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 02 |
| 18 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 189 |
| 19 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 10 |
| 20 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 04 |
| 21 | ශ්‍රී ලංකා විදේශ සේවය | 02 |
| 22 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 23 | නීතිපති දෙපාර්තමේන්තුව | 07 |
| 24 | අපනයන කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව | 01 |
| 25 | අධිකරණ අමාත්‍යාංශය | 01 |
| 26 | රේගු දෙපාර්තමේන්තුව | 131 |
| 27 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවය | 07 |
| 28 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| | **එකතුව** | **528** |

**වගුව අංක 18**

| **අනු අංකය** | **වැඩ බැලීම, රාජකාරි ඉටු කිරීමට පත්කිරීම (ප්‍රාදේශීය ලේකම්)** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 81 |

**වගුව අංක 19**

### 5.4 විනය අංශය

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24, 1990/25 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන් හැර අංක 1955/22 හා 2016.02.25 හා 2016/37 හා 2018.04.26 දිනවලින් සංශෝධිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. විනය අංශය වෙත ලැබෙන සියලුම ලිපි ලේඛන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

#### 5.4.1 විනය අංශයෙහි කාර්යභාරය

5.4 ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**(1) විනය කටයුත්තක් සම්බන්ධයෙන්**

I. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ තොරතුරු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

II. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාළ නිලධාරියාට පරිපාලන බලධරයා හා අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

III. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරීක්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනා වලින් නිදහස් කිරීම හෝ සුදුසු විනය දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

IV. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණයේ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි ද පරීක්ෂණ නිලධාරිගේ , පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරිගේ සහ රැකවරණ නිලධාරිගේ වාර්තාවන් ද සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලටම වරදකරු කොට සුදුසු විනය නියෝගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

V. තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක්කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිම් විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කිරීම හෝ සිදු කරනු ලැබේ.

**(02) අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ සෞඛ්‍ය සේවා කමිටුව විසින් ලබා දෙන විනය නියෝගවලට අදාළව කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව 2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 හා සහ 2018.02.01 දිනැති අංක 2004/49 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට සෞඛ්‍ය සේවා කමිටුව විසින් පනවනු ලබන විනය නියෝගයන්ට එරෙහිව එම නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු ද එම අභියාචනා සම්බන්ධයෙන් අදාළ කමිටුව විසින් සහ එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් වෙත සහන සැලසීම/අභියාචනා ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

**(03) සේවය හැරයාමේ නිවේදනවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන්**

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන 2016.02.25 දිනැති අංක 1955/22 හා 2018.04.26 දිනැති අංක 2016/37 ගැසට් නිවේදන මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20

දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරින්ගේ සේවය හැරයාමේ නිවේදනවලට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු සහ එම අභියාචනා සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/නොපිහිටුවීම සිදු කරනු ලැබේ.

**(04) උපරිමාධිකරණ, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**

කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණයට ගොනු කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙත සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම හා අභියාචනා කැඳවනු ලබන දිනවලදී එම ආයතනයන්හි පෙනී සිටීම ද මානව හිමිකම් කොමිසම විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීම ද කරනු ලැබේ.

**04. 2016 අංක දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු**


2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා නම්කළ නිලධාරී විසින් විමසන තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම

### 5.4.2 විනය අංශයේ ප්‍රගතිය - (2019.01.01 – 2019.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විනය කටයුතු අවසන් කිරීම් ( මූලික විමර්ෂණ වාර්තාවෙන් පසුව/ දීර්ඝ පිළිතුරෙන් පසුව) | 13 |
| 02 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 37 |
| 03 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 06 |
| 04 | විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම | 26 |
| 05 | පරීක්ෂණ මණ්ඩල සංශෝධනය කිරීම් | 05 |
| 06 | චෝදනා වලින් නිදහස් කිරීම | 09 |
| 07 | සේවයෙන් පහකිරීම | 03 |
| 08 | අනෙකුත් විනය දඬුවම් | 22 |
| 09 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්ථනය කිරීම | 06 |
| 10 | වැඩ තහනම් කිරීම | 04 |
| 11 | අනිවාර්ය නිවාඩු ගැන්වීම් | 01 |
| 12 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 යටතේ විශ්‍රාම ගැන්වීම | 07 |
| 13 | ස්ථාන මාරු කිරීම් | 06 |
| 14 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 08 |
| 15 | විදේශ නිවාඩු අනුමත කිරීම් | 29 |
| 16 | අභියාචනා ප්‍රතික්ශේප කිරීම් (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය | 08 |

| | | |
|---|---|---|
| | සේවා කොමිෂන් සභා නියෝග සඳහා) | |
| 17 | අභියාචනා සඳහා එකඟවීම් (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සඳහා) | 02 |
| 18 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම් (සේවය හැරයාමේ නියෝග සඳහා | 10 |
| 19 | අභියාචනා සඳහා එකඟවීම් | 07 |
| 20 | විනය පරීක්ෂණ නිලධාරීන් සංචිතයේ ලියාපදිංචි කිරීම් | 02 |
| 21 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 221 |
| 22 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ විභාගවන අභියාචනා සඳහා නිරීක්ෂණ | 40 |
| 23 | අධිකරණ අයදුම්පත් සඳහා නිරීක්ෂණ | 10 |
| 24 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ නියෝග ක්‍රියාත්මක කිරීම | 209 |
| 25 | ආයතන සංග්‍රහයේ වගන්තීන්හී සංශෝධන | 01 |
| 26 | නැවත සේවයේ පිහිටුවීම | 06 |
| | **එකතුව** | **698** |

**වගුව අංක 19**




**රූපසටහන අංක 04**

**5.5 අභියාචනා අංශය**

බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහාත්, එම අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීම සඳහාත් කොමිෂන් සභාවට සහය ලබා දීම අභියාචනා අංශය මගින් සිදු කරයි.

**5.5.1. අභියාචනා අංශයේ කාර්යභාරය**

i. එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා කැඳවීම.

ii. ඉන් පසුව එක් එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

iii. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

iv. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

vi. මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

vii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ /නිර්දේශ ඉදිරිපත් කිරීම.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.


ix. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අයදුම්පත්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

x. ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

### 5.5.2 අභියාචනා අංශයේ ප්‍රගතිය (2019.01.01 – 2019.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වර්ෂය තුළ ලැබුණු අභියාචනා | 2091 |
| 02 | වාර්තා ලැබී නොමැති අභියාචනා | 406 |
| 03 | වාර්තා ලැබී කටයුතු කරමින් පවතින අභියාචනා | 103 |
| 04 | වර්ෂය තුළ කටයුතු නිමකළ අභියාචනා ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 2395 |
| 05 | දැනට පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 44 |
| 06 | දැනට පවතින අභියාචනාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 07 |
| 07 | දැනට පවතින පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 123 |
| 08 | මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | 23 |

**වගුව අංක 20**




**රූප සටහන අංක 05**

### 5.6 පාලන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පාලන අංශය වෙත පැවරී ඇත. අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

පාලන අංශය පහත සඳහන් කාර්යභාරය මෙහෙයවනු ලබයි

- ආයතනය වෙත ලැබෙන සියලුම ලිපි තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා අංශ අතර බෙදා හැරීම
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු
- කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධ කටයුතු
- ආයතනයේ කාර්යභාරය හා ප්‍රගතිය පිළිබඳව කාර්තු වශයෙන් හා වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම
- සේවාලාභීන් වෙනුවෙන් මහජන හමුවීම් සම්බන්ධීකරණය කිරීම
- ආයතනයට අයත් වාහනවලට අදාළ සියලු පරිපාලන කටයුතු
- ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු හා ආරක්ෂක සේවය සම්බන්ධ කටයුතු
- අනුමත සේවක සංඛ්‍යාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කිරීම හා නව තනතුරු ඇති කිරීම සම්බන්ධ කටයුතු

### 5.7 මූල්‍ය අංශය

මෙම අංශය කොමිෂන් සභා කාර්යාලය සඳහා නිර්බාධ මූල්‍ය තොරතුරු ප්‍රවාහයක් සහ කළමනාකරණ පද්ධතියක් සහතික වෙමින් මූල්‍යමය සේවා සපයයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සපුරාලනු ලැබේ.

- කොමිෂන් සභා කාර්යාලය සඳහා මූල්‍ය සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ හා සේවා සැපයීම
- ස්ථාවර වත්කම් කළමනාකරණය
- මූල්‍යමය කරුණු සම්බන්ධව මාර්ගෝපදේශනය සහ උපදේශනය
- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන ලේකම්වරයාට මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳව යාවත්කාලීන තොරතුරු සැපයීම
- අංශ අතර මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම

### 5. 8. අභ්‍යන්තර විගණන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇති මෙම අංශය මගින් 2019 වර්ෂය තුළ පහත දැක්වෙන කාර්යභාරය ඉටු කර ඇත.

ආයතන තුළ ඵලදායී කාර්ය සාධනයක් හා සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රමයක් තහවුරු කිරීම පිණිස,

- මූල්‍ය විගණනය
- පද්ධති විශ්ලේෂණය හා කාර්ය සාධන විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කරමින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීමත් ඒ අනුව ආයතනයේ සියළුම අංශ ආවරණය වනසේ අඛණ්ඩව වසර පුරා අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම හා පැවැත්වීම මගින් කළමනාකරණ තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් ඉහළ කළමනාකරණයට අවශ්‍ය සහයෝගය ලබා දීම

## 6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1989/27 හා 2016.10.19 දිනැති ගැසට් නිවේදනය මගින් අධ්‍යාපන සේවා කමිටුව පත්කර ඇති අතර අංක 1989/29 හා 2016.10.10 , අංක 1992/07 හා 2016.11.07 සහ අංක 2014/03 හා 2017.04.11 දිනැති ගැසට් නිවේදන මගින් උක්ත කමිටුව වෙත බලතල පැවරීම හා සංශෝධනය කිරීම් සිදුකර ඇත. අංක 2014/3 හා 2017.04.11 දිනැති ගැසට් නිවේදනය මගින් පවරන ලද බලතල අනුව 2017.04.07 දින සිට අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යයන් සිදු කෙරේ.

### 6.1 අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය

අංක 2014/3 හා 2017.04.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අධ්‍යාපන සේවා කමිටුව පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරනු ලැබේ.

- අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවය ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලීමේ/රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත්කිරීම, මුදා හැරීම (ස්ථිර/ තාවකාලික), සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය හැර යාමේ නිවේදනවලට එරෙහි අභියාචනා පිළිබඳව සළකා බැලීම, සේවයට / තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම හැර) හා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම

- අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි/ උසස් කිරීමේ පටිපාටි අනුව උසස් කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත)

- කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම

- අධ්‍යාපන සේවා කමිටුවේ විෂය පථයට අයත් නිලධාරීන්ට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම


- 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ තොරතුරු ලබා දීම

### 6.2 අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය ( 2019.01.01 – 2019.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චෝදනාපත්‍ර නිකුත් කිරීම | 06 |
| 02 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 02 |
| 03 | අවසන් විනය නියෝග ලබා දීම | 16 |
| 04 | විනය පරීක්ෂණ නිලධාරින් පත් කිරීම | 06 |
| 05 | බඳවා ගැනීම් | 14 |
| 06 | ස්ථිර කිරීම් | 172 |
| 07 | උසස් කිරීම | 814 |

| | | |
|---|---|---|
| 08 | විශ්‍රාම ගැන්වීම් | 230 |
| 09 | අන්තර්ග්‍රහණය කිරීම | 458 |
| 10 | මුදා හැරීම් (තාවකාලික) | 61 |
| 11 | මුදාහැරීම් (ස්ථිර) | 43 |
| 12 | ස්ථාන මාරු | 10 |
| 13 | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 208 |
| 14 | තනතුරුවලට පත්කිරීම | 07 |
| 15 | නැවත සේවයේ පිහිටුවීම් | 01 |
| 16 | රාජකාරි ආවරණයට පත්කිරීම් | 01 |
| 17 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 01 |
| 18 | අනෙකුත් නියෝග | 323 |
| 19 | දේශපාලන පළිගැනීම් සහන සම්බන්ධ සාමාන්‍ය නියෝග | 07 |
| | එකතුව | 2380 |

**වගුව අංක 21**




**රූප සටහන අංක 06**

## 7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

අංක 1990/24 හා 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා කමිටුව වෙත බලතල පවරා ඇත. අංක 2004/49 හා 2017.02.01 දිනැති සහ අංක 2009/18 හා 2017.03.08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් උක්ත කමිටුව වෙත බලතල පැවරීම සංශෝධනය කර ඇත. අංක 1989/28 හා 2016.10.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටු සඳහා කාර්ය පටිපාටිය හා ගණ පූරණය සඳහා වූ රීති ප්‍රකාශයට පත්කර ඇත.

අංක 1990/25 හා 2016.10.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2016.10.27 දින සිට ක්‍රියාත්මකවන පරිදි එම කමිටුව සඳහා සාමාජිකයින් පත්කර ඇත. ඉහත කමිටු සාමාජිකයින්ගේ ධූර කාලය 2018.10.31 දිනෙන් අවසන් වී ඇති අතර 2018.11.01 දින සිට නව කමිටු සාමාජිකයින් පත්කර ඇත.

### 7.1 සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය

ඉහත සඳහන් බලතල පැවරීම ප්‍රකාරව කමිටුව වෙත ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම මෙම කමිටුවේ කාර්යභාරය වේ.


### 7.2 සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය ( 2019.01.01 – 2019.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යව |
|---|---|---|
| 01 | විශ්‍රාම ගැන්වීම් | 264 |
| 02 | ස්ථිර කිරීම් | 1855 |
| 03 | බඳවාගැනීම් | 3566 |
| 04 | 2017 වර්ෂයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද මෙතෙක් විධිමත් පත්වීම් ලිපි නිකුත් කර නොමැති වෛද්‍යවරුන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම | 27 |
| 05 | විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම | 460 |
| 06 | උසස්කිරීම් | 3231 |
| 07 | මුදාහැරීම් | 42 |
| 08 | ස්ථාන මාරුකිරීම් | 5169 |
| 09 | ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා | 54 |
| 10 | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 221 |
| 11 | ඉල්ලා අස්වීම් | 23 |
| 12 | වැඩ බැලීම් | 59 |
| 13 | චෝදනාපත්‍ර නිකුත්කිරීම් | 58 |
| 14 | චෝදනාපත්‍ර සංශෝධනය කිරීම් | 04 |
| 15 | චෝදනාවලින් නිදහස් කිරීම ( විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව) | 05 |
| 16 | චෝදනාවලින් නිදහස් කිරීම ( චෝදනාපත්‍රයට දීර්ඝ පිළිතුර මත) | 05 |
| 17 | චෝදනාවලින් නිදහස් කිරීම් - චෝදනාපත්‍ර නිකුත් නොකර | 05 |

| | | |
|---|---|---|
| 18 | සෙසු විනය දඬුවම් | 30 |
| 19 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 02 |
| 20 | නැවත සේවයේ පිහිටුවීම | 02 |
| 21 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්ථනය කිරීම | 02 |
| 22 | අනිවාර්ය නිවාඩු ගැන්වීම් | 03 |
| 23 | වැඩ තහනම් කිරීම | 01 |
| 24 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 08 |
| 25 | විධිමත් විනය පරීක්ෂණ සඳහා නිලධාරීන් පත්කිරීම | 25 |
| 26 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 103 |
| 27 | වෙනත් නියෝග | 12 |
| | එකතුව | 15236 |

වගුව අංක 22

## සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය
## (2019.01.01 – 2019.12.31)




**රූප සටහන අංක 07**

## 8 මුදල් ප්‍රතිපාදනය

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන | 222,841,000.00 | 215,524,766.75 | 7,316,233.25 |
| ප්‍රාග්ධන | 39,489,000.00 | 34,928,713.26 | 4,560,286.74 |
| එකතුව | 262,330,000.00 | 250,453,480.01 | 11,876,519.99 |

වගුව අංක 23

## 9. කාර්ය මණ්ඩලය

### 9.1 සංවිධාන සටහන

සංවිධාන සටහන සඳහා ඇමුණුම 03 බලන්න.

### 9.2 කාර්ය මණ්ඩල සංයුතිය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 229 කින් සමන්විත වූ අතර එම කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සත්‍ය වශයෙන්ම සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලය 214 ක් විය. එහි කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**කාර්ය මණ්ඩල විස්තර**

| තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ලේකම් | 01 |
| අතිරේක ලේකම් | 02 |
| කමිටු ලේකම් | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 08 |
| සහකාර ලේකම් | 32 |
| ගණකාධිකාරී | 02 |
| පරිපාලන නිලධාරී | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 02 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 114 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| රියදුරු | 13 |
| කාර්යාල කාර්ය සහායක | 31 |
| විදුලි කාර්මික | 01 |
| ජලනල කාර්මික | 01 |
| **එකතුව** | **214** |

වගුව අංක 24

### 9.3 කාර්ය මණ්ඩල පුහුණු කටයුතු

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ විෂය දැනුම, භාෂා ප්‍රවීනතාවය, තාක්ෂණික දැනුම හා විශේෂ කළමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමේ අවස්ථාව 2018 වර්ෂය තුළද ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

| ශ්‍රේණිය | දේශීය | විදේශීය |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 01 | 09 |
| මාණ්ඩලික නොවන නිලධාරීන් | 07 | ---- |

**වගුව අංක 25**

### 10. 2019 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන

| අංශය | ශ්‍රේෂ්ඨාධිකරණය | අභියාචනාධිකරණය | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය |
|---|---|---|---|
| ආයතන | 71 | 14 | 32 |
| පත්කිරීම් | 40 | 16 | 87 |
| උසස්කිරීම් | 50 | 06 | 98 |
| විනය | 09 | 07 | 50 |
| අභියාචනා | 44 | 07 | 123 |
| අධ්‍යාපන සේවා කමිටුව | 05 | 01 | --- |
| සෞඛ්‍ය සේවා කමිටුව | 11 | 00 | 00 |
| **එකතුව** | **230** | **51** | **390** |

**වගුව අංක 26**

### 11. කොමිෂන් සභා රැස්වීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභා රැස්වීම් 97 ක් පවත්වා ඇත.

### 12. අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම්

සේවාලාභීන් වෙනුවෙන් ආයතනයේ අංශවලින් ඉටුවන කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග රැස්වීම් පැවැත්වීමටත් ඒ මගින් ගැටළු නිරාකරණය කර ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමටත් කටයුතු කර ඇත.

| අනු අංකය | දිනය | කාරණය | සහභාගී වූ දෙපාර්තමේන්තු / අමාත්‍යංශ/ආයතන |
|---|---|---|---|
| 01 | 2019.01.08 | විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 02 | 2019.01.11 | දීපව්‍යාප්ත සේවාවන්ට අදාළවන විවෘත බඳවා ගැනීම සඳහා බඳවාගැනීම් ක්‍රමවේදයක් සකස් කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 03 | 2019.01.25 | ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරට බඳවා ගැනීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| 04 | 2019.01.27 | මිනින්දෝරු සේවයේ උසස්වීම් | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 05 | 2019.02.05 | විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2019 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 06 | 2019.02.07 | ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු | රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය |
| 07 | 2019.02.08 | කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම - කේ.එස්.කේ. චන්ද්‍රසේකර මයා - බලයලත් නිලධාරී | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| 08 | 2019.02.12 | දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින ගැටළු | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 09 | 2019.02.12 | 1. ශ්‍රී ලංකා විදුහල්පති සේවය<br>විධිමත් බඳවා ගැනීමෙන් පසු පළාත් සභා වෙත අනුයුක්ත කරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරු ස්ථානගත කිරීමේදී ඇතිවන ගැටළු<br>පළාත් සභාවලට අනුයුක්ත කර ඇති විදුහල්පතිවරුන් අවශ්‍ය අවස්ථාවන්හිදී ජාතික පාසල්වලට නිදහස් කිරීමේදී ඇතිවන ගැටළු<br>වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සඳහා පළාත්සභා අනුගත නොවීම සම්බන්ධ ගැටළු<br>පළාත්සභා පාසල්වලට අනුමතව ඇති ශ්‍රේණිගත විදුහල්පතිවරු සංඛ්‍යාව පිළිබඳව නිශ්චිත තොරතුරු නොමැති වීම<br>2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව පළාත්සභාවල සිටිය යුතු එක් එක් ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙන නොමැති වීම<br>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් සකස් කිරීම<br>මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික ස්ථාන | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | | මාරු පටිපාටියට අනුකූලවන පරිදි පළාත් පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරු පටිපාටිය සඳහා පළාත් පාසල් හා ජාතික පාසල්වල විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති ආදී තනතුරු ඇතුළත්වන පරිදි සේවා ව්‍යවස්ථාව සැකසීම හා ඊට අනුගත වීම<br>3. ශ්‍රී ලංකා ගුරු සේවය<br>පළාත්සභාව සමග ඒකාබද්ධව ජාතික පාසල් ගුරුවරු ස්ථාන මාරු කිරීම<br>ගුරුවරුන් බඳවා ගැනීමේදී අදාළ විෂයයට බඳවා ගැනීම<br>ගුරු සේවා ව්‍යවස්ථාවේ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම | |
| 10 | 2019.02.14 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව<br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 11 | 2019.02.18 | නීති උපදේශක තනතුරට පත්කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය |
| 12 | 2019.02.26 | නාවික සමීක්ෂක තනතුරට පත්කිරීම | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන. වාරි මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 13 | 2019.03.06 | සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට පත්කිරීම | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 14 | 2019.03.11 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්කිරීමේ නිවැරදි ක්‍රමවේදය<br>පළාත් තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමේ නිවැරදි ක්‍රමවේදය<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීම<br>පළාත් සඳහා අනුයුක්ත කරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් ස්ථානගත කිරීමේ ගැටළු<br>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා පළාත්වල එකඟතාවය ලබා ගැනීමේ ගැටළු<br>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසැල්වලට මුදාහැරීම සම්බන්ධ ගැටළු<br>පළාත් පාසල් සඳහා අනුමත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ | අධ්‍යාපන අමාත්‍යාංශය<br>සියලුම පළාත් සභා |

| | | | |
|---|---|---|---|
| | | සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අනුමත තනතුරු පිළිබඳ තොරතුරු අදාළ සේවා ව්‍යවස්ථාවන්ට ඇතුළත්වීමේ අවශ්‍යතාවය<br>පළාත්වලින් ලබා දී ඇති ඇතැම් විනය නියෝග, 12 වගන්තියට යටත්කොට විශ්‍රාම ගැන්වීම් නිර්දේශ ප්‍රමාද වීම<br>සේවය ස්ථිර කිරීම. විශ්‍රාම ගැන්වීම. වැනි දෛනික රාජකාරිවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම | |
| 15 | 2019.03.12 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා පෙනී සිටීමේ සුදුසුකම් ඇගයීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 16 | 2019.03.12 | තාක්ෂණ සේවයේ උසස්වීම් | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 17 | 2019.04.01 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුරට පත්කිරීම | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| 18 | 2019.04.02 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම<br>ජාතික පාසල්වල විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ තනතුරු සඳහා පත්කිරීම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 19 | 2019.04.04 | කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තු විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තාක්ෂණ සේවයේ උසස්කිරීම් සම්බන්ධ ගැටළු | රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |
| 20 | 2019.04.04 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ තනතුරුවලට බඳවා ගැනීම (අධ්‍යක්ෂ, ලේඛකාධිකාරී, මූලස්ථාන ක්‍රීඩා නිලධාරී) | විදුලි සංදේශ. විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය |
| 21 | 2019.04.08 | PSC/APP/8/6/66/2017 ගොනුවේ ජයසේන මයාගේ අභියාචනය | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 22 | 2019.04.24 | ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා විවෘත / සීමිත තරඟ විභාගය - 2018 | රාජ්‍ය පරිපාලන,ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 23 | 2019.04.30 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (දෙපා) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 24 | 2019.05.09 | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් අවසන් සේවා ස්ථාන සඳහා පත්කිරීම | සෞඛ්‍ය. පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 25 | 2019.05.30 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම | කෘෂිකර්ම. පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 26 | 2019.06.06 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් පවත්නා ගැටළු | රාජ්‍ය පරිපාලන. ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 27 | 2019.06.10 | තැපැල් දෙපාර්තමේන්තුවේ ගැටළු | තැපැල් දෙපාර්තමේන්තුව |
| 28 | 2019.06.13 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම, පුහුණු කිරීම හා ස්ථානගත කිරීම සම්බන්ධ ගැටළු<br>බඳවා ගැනීම<br>පුහුණු කිරීම<br>ස්ථානගත කිරීම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට සහ විශේෂ ශ්‍රේණියට නිලධාරීන් උසස් කිරීම<br>I ශ්‍රේණියට උසස් කිරීම<br>විශේෂ ශ්‍රේණියට උසස් කිරීම<br>ස්ථාන මාරු පටිපාටියක් සකස් කිරීම<br>උපලේඛනගත තනතුරු සඳහා නිලධාරීන් විධිමත්ව පත්කිරීම හා එම තනතුරු අතර ස්ථාන මාරුවීම<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු තනතුරු සඳහා විධිමත්ව නිලධාරීන් පත්කිරීම<br>විශේෂ ශ්‍රේණියේ තනතුරු සංඛ්‍යාව ඉහල දැමීම<br>ජාතික පාසැල් සඳහා විදුහල්පතිවරුන් පත්කිරීම<br>(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I,II,III පන්තියේ විදුහල්පතිවරු පත්කළයුතු පාසල් හඳුනා ගැනීම)<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 සංශෝධනය අනුව1AB 1C පළාත් පාසැල් සඳහා විදුහල්පතිවරුන් පත්කිරීම<br>විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීම<br>වෙනත් කරුණු<br>දේශපාලන හේතූන් මත ගැටළුවලට මුහුණදුන් නිලධාරීන්ට සහන සැලසීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලද පසු ඒ අනුව කටයුතු කරන ලෙස අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් දෙන ලදී. | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 29 | 2019.06.21 | ශ්‍රී ලංකා රජයේ පුස්ථකාලයාධිපති සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | රාජ්‍ය පරිපාලන. ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 30 | 2019.06.25 | ශ්‍රී ලංකා තක්සේරු සේවයේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරු තනතුරට පත්කිරීම | මුදල් අමාත්‍යාංශය |
| 31 | 2019.06.28 | වාරිමාර්ග - නේවාසික ව්‍යාපෘති කළමනාකරු බඳවා ගැනීම | කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 32 | 2019.07.08 | දිස්ත්‍රික් විද්‍යාත්මක හා තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීම | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය |
| 33 | 2019.07.18 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පිරවීම | කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 34 | 2019.07.23 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් පවත්නා ගැටළු | රාජ්‍ය පරිපාලන. ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 35 | 2019.07.25 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේතුව |
| 36 | 2019.07.25 | ජාතික පාසැල් විදුහල්පති පුරප්පාඩු පිරවීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන<br>ලකුණු පටිපාටිය සංශෝධනය කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 37 | 2019.08.02 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධිපන්තියේ මිනුම් සේවා හා උපක්‍රම පරික්ෂකවරුන්ගේ උසස්කිරීම් | මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව |
| 38 | 2019.08.07 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 39 | 2019.08.08 | දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ ස්ථිර මාර්ග විශේෂ පන්තියට උසස් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 40 | 2019.08.28 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ (උද්‍යාන සංවර්ධන සහකාර) තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම | සංචාරක සංවර්ධන. වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 41 | 2019.09.03 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇතිකිරීමට නියමිත වන සේවාව | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 42 | 2019.09.12 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ වන පාලක තනතුරට පත්කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| 43 | 2019.09.20 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය සංශෝධනය කිරීම | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 44 | 2019.09.26 | සුරාබදු අධිකාරී තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2010(2012) | මුදල් අමාත්‍යාංශය<br>සුරාබදු දෙපාර්තමේන්තුව<br>විභාග දෙපාර්තමේන්තුව |
| 45 | 2019.09.27 | තැපැල් අධිකාරී තනතුරට ජ්‍යෙෂ්ඨ හා කුසලතාවය මත බඳවා ගැනීම | තැපැල් දෙපාර්තමේන්තුව |
| 46 | 2019.10.01 | තාක්ෂණ සේවයේ විවෘත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා පොදු විභාගයක් පැවැත්වීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 47 | 2019.10.02 | දේශිය ආදායම් සේවයේ IIIශ්‍රේණියට පත්වීම් ලබා දීම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 48 | 2019.10.04 | සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) II ට උසස් කිරීම | ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 49 | 2019.10.10 | දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණදුන් අයට සහන සැලසීම (ගාමිණී කුමාර ද සිල්වා මහතා) | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
| 50 | 2019.10.17 | සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 51 | 2019.10.23 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය |
| 52 | 2019.10.28 | සේවයෙන් මුදා හැරීම - එච්.එල්.එම්. සේනාරත්න මිය | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| 53 | 2019.10.28 | නීති නිලධාරීන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇති ආකාරය නිවැරදි කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 54 | 2019.10.30 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා පත්කිරීම | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 55 | 2019.11.04 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති II වන කාණ්ඩය (රජයේ නිලධාරීන්ගේ විනය පාලනය සම්බන්ධව) සකස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ වැඩමුළුව | රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 56 | 2019.11.05 | පළාත් රාජ්‍ය සේවයේ සිට රාජ්‍ය සේවය සඳහා ස්ථාන මාරු කිරීමට අදාළ විධිවිධාන සකස් කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය (මධ්‍යම, නැගෙනහිර, වයඹ)<br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 57 | 2019.11.06 | AAT/96/2017(PSC) දරන අභියාචනයට අදාළව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය විසින් ලබා දුන් නියෝගය ක්‍රියාත්මක කිරීමේදී | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | | උද්ගත විය හැකි ගැටළුකාරී තත්ත්වය | |
| 58 | 2019.11.07 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ අධ්‍යක්ෂ. අතිරේක අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ. විදුහල්පති තනතුරුවලට පත්කිරීම/ වැඩ බැලීමට පත්කිරීම. පත්කිරීම් සම්බන්ධ ගැටළු | කර්මාන්ත හා වාණිජ කටයුතු. දිගු කාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම්. සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය |
| 59 | 2019.11.20 | උතුරු නැගෙනහිර ස්ථාන මාරු | සෞඛ්‍ය. පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 60 | 2019.11.22 | ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ නිලධාරී පී.එස්.අගලවත්ත මහතා II ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීම | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 61 | 2019.12.02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ AAT/98/2019 හා SC(FR) 479/2012 | රාජ්‍ය පරිපාලන. ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 62 | 2019.12.02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2019.07.01 දිනැති විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| 63 | 2019.12.02 | තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරට පත්කිරීම | මුදල් අමාත්‍යාංශය තක්සේරු දෙපාර්තමේන්තුව |
| 64 | 2019.12.12 | ජාතික පාසැල් විදුහල්පති පත්කිරීමේ ලකුණු පටිපාටිය<br>ජාතික පාසල් විදුහල්පති පුරප්පාඩු පිරවීම<br>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරට පත්කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 64 | 2019.12.17 | වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු, නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ උසස්වීම් සහ වෙනත් ගැටළු | සෞඛ්‍ය. පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 65 | 2019.12.19 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාළගුණ විද්‍යා නිරීක්ෂණ නිලධාරී වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුමත කර ගැනීම | කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |

**වගුව අංක 27**

## 13. ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද බොහෝ සුවිශේෂ කටයුතු වලදී සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද, විශේෂයෙන් ,

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- නීතිපති දෙපාර්තමේන්තුව හා
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය ද

දක්වනු ලැබූ අනුබලය හා දායකත්වය වෙනුවෙන් කොමිෂන් සභාවේ කෘතවේදීත්වය මෙහිලා විශේෂයෙන් සනිටුහන් කළ යුතු වේ.

| | |
|---|---|
| ඩී. දිසානායක මහතා | සභාපති |
| ආචාර්ය පී.රාමනුජම් මහතා | සාමාජික |
| වී. ජෙගරාසසිංගම් මහත්මිය | සාමාජික |
| එස්.රනුග්ගේ මහතා | සාමාජික |
| ඩී.එල්. මෙන්ඩිස් මහතා | සාමාජික |
| එස්.ඒ.සී.එස්. ඩබ්ලිව් ජයතිලක මහතා | සාමාජික |
| මහාචාර්ය ඒ.ජී. හුසයින් ඉස්මායිල් මහතා | සාමාජික |
| සුධර්මා කරුණාරත්න මහත්මිය | සාමාජික |
| ජී.එස්.ඒ. ද සිල්වා මහතා | සාමාජික |

ඇමුණුම 01

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2019.01.01 දිනට නිම නොවී තිබූ පැමිණිලි සංඛ්‍යාව | 2019 වසර තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 2019.12.31 දිනට ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළපැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ පැමිණිලිසංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ පැමිණිලිසංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 239 | 102 | 341 | 64 | 29 | 248 |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2019.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2019 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2019.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 140 | 38 | 178 | 22 | 05 | 151 |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2019.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2019 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2019.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 31 | 08 | 39 | 03 | 03 | 33 |

- ඉහත අභියාචනාවලට අමතරව 2019.01.01 – 2019.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත පැමිණිලි 01 ක් යොමුකර තිබුණි.
- 2019.01.01 – 2019.12.31 කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 01 කි
- 2019.01.01 – 2019.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 08 ක් සඳහා කටයුතු කර ඇත.

ඇමුණුම 02

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2019.01.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2019 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2019.12.31 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 169 | 100 | 269 | 101 | 26 | 142 |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2019.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2019 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2019.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 78 | 13 | 91 | 12 | 00 | 79 |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**


| 2019.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2019වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2019.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2019.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 12 | 06 | 18 | 00 | 00 | 18 |

- 2019.01.01 - 2019.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබද පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත පැමිණිලි 01 ක් ඉදිරිපත් කර ඇත.
- සමාලෝචිත කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර නැත.
- 2019.01.01 - 2019.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාව 24 කි.

ඇමුණුම 03

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව
## සංවිධාන සටහන

අ.ති.ලේ - අතිරේක ලේකම්
ජ්‍යෙ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ - සහකාර ලේකම්
අභ්‍ය. විගණක - අභ්‍යන්තර විගණක
පරි.නි - පරිපාලන නිලධාරී
තො.සං.තා.නි - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තො.සං.තා.ස - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
භාෂා.පරි - භාෂා පරිවර්තක
ක.සේ.නි - කළමනාකරණ සේවා නිලධාරී
විදුලි කාර් - විදුලි කාර්මික ශිල්පී
ජලනල කාර්. - ජලනල කාර්මික ශිල්පී
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය



මගේ අංකය / எனது இல. / My No. } ජේපීඒ/ඊ/පීඑස්සී/219/32 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජුනි 15 දින.

කාර්යාලය
16 JUN 2020
201214

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

Acct

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

ගිණුම් අංශය
17 JUN 2020
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.5.3.(ii) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදි නොවීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතවල වටිනාකම නිවැරදි නොවුණි. | 2019 ජනවාරි 01 දිනට දේපල පිරියත උපකරණ වටිනාකම නිවැරදි කිරීම. |

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 පුනරාවර්තන වියදම්

6-1-1-0-1506 දරන රජයේ නිලධාරීන් සඳහා දේපල ණය පොලී යන වැය විෂයයෙහි වියදම වූ රු. 1,383,771 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සහනාධාර , ප්‍රදාන හා මාරුකිරීම් යටතේ දැක්විය යුතු වුවත් එම වියදම පොලී ගෙවීම් යටතේ දක්වා තිබුණි.

**1.6.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**1.6.2.1** මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේපළ පිරියත හා උපකරණ වටිනාකම තුල රු.39,000,000 ක කල්බදු වත්කම් ඇතුළත් කර තිබියදී මූල්‍ය වත්කම් යටතේ කල්බදු වත්කම් ලෙසත් ශුද්ධ වත්කම් හා ස්කන්ධය යටතේ කල්බදු වත්කම් සංචිත ලෙසත් නැවත රු.39,521,040 ක් වාර්තා කර තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල කල්බදු වත්කම් ද්විගණනයක් සිදු වී තිබුණි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ ශේෂය නිවැරදි නොවීම නිසා දේපළ පිරියත හා උපකරණ සංචිතයද නිවැරදි නොවුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි කල්බදු වත්කම් ලෙස රු.39,521,040 ක් (කල්බදු වටිනාකම හා මුද්දර ගාස්තුවෙහි එකතුව) නිවැරදිව දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි එය රු.39,000,000 ක් ලෙස (මුද්දර ගාස්තු රහිතව) දක්වා තිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් 2019 ජූලි 25 දින සිදු කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරුවේදී වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ ඇති කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල තක්සේරු වටිනාකම රු.78,000 ක් වැඩියෙන් CIGAS මෘදුකාංගයට ඇතුලත් කිරීම නිසා කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම රු.78,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) කොමිෂන් සභාව සතුව පැවති රු.875,000 ක් පිරිවැය වූ වාහනයක් 2019 ජනවාරි 09 වන දින රු.1,258,000 කට විකුණා තිබුණු නමුත් මෙම වාහනය සම්බන්ධ තොරතුරු ආරම්භක ශේෂයේ හෝ අපහරණයන් යටතේ ඇතුලත් කර නොතිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් 2019 අගෝස්තු 01 දින පවත්වන ලද වෙන්දේසියේදී භාණ්ඩ වර්ග 09 ක් රු.1,212 ක වටිනාකමකට අපහරණය කර තිබුණි. තවද භාණ්ඩ 10 ක් විනාශ කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් අපහරණ යටතේ දක්වා නොතිබුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

------------------------

### 1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ දක්වා ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා වූ ආකෘති පත්‍රයට අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.8,224,278 ක් හා අග්‍රිම ලැබීම් ලෙස රු.241,882,000 ක් දක්වා එකතුව රු.250,106,278 ක් ලෙස දැක්විය යුතු වුවත් ආදායම් නොවන ලැබීම් යටතේ රු.241,882,000 ක් පමණක් දක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස එම අගයම දක්වා තිබුණි.

(ආ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා වූ ගෙවීම රු.218,172,153 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුල එය රු.215,342,217 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ සහනාධාර හා මාරු කිරීම් ලෙස රු.1,383,771 ක් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස රු.695,558 ක් දැක්විය යුතු වුවත් සහනාධාර සහ මාරු කිරීම් යටතේ රු.695,558 ක් පමණක් දක්වා තිබුණි.

### 1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ හිමිකම් ඉවත්වීමෙ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ කොමිෂන් සභාව සතු වාහනයක් විකිණීමෙන් ලද රු.1,258,000 ක මුදල සටහන් විය යුතු වුවත් ඒ යටතේ රු.2,284,808 ක් දක්වා තිබුණි.

(ආ) චක්‍රලේඛයේ ආකෘතියට අනුව ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ලෙස රු.8,216,995 ක් දැක්විය යුතු වුවත් එම ලැබීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.30,715,005 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දැක්විය යුතු වුවත් එය රු.34,688,470 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) අත්තිකාරම් ගෙවීම් ලෙස රු.7,976,751 ක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ දැක්විය යුතු වුවත් එය අත්තිකාරම් ගෙවීම් ලෙස දක්වා නොතිබුණි.

**1.6.3.3 මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

-----------------------------------------------

තැන්පතු ලැබීම් ලෙස රු.425,103 ක් හා මුදල් වැය කිරීම් යටතේ තැන්පතු ගෙවීම් ලෙස රු.1,063,137 ක් දැක්විය යුතු වුවත් තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් ලෙස රු.638,034 ක් දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වෙනත් නිරීක්ෂණ

---------------------------------------------------

(අ) කොමිෂන් සභාව සතු මෝටර් රථයක් 2019 දෙසැම්බර් 31 දින අනතුරට ලක්වීම නිසා ඇති වූ අලාභය රු.301,962 ක් ලෙස ඇස්තමේන්තු කර පැවතියද ඒ සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 2 (ii) ආකෘතියෙහි ඉතිරිය/(ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතු තීරුවේ එකතුව සඳහා සටහන් කර ඇති ප්‍රතිශතය නිවැරදි නොවීය. තවද ඒසීඒ 2 (iii) ආකෘතියෙහිද එකතුව සඳහා දක්වා ඇති ප්‍රතිශතයන් නිවැරදිව දක්වා නොතිබුණි.

(ඇ) 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුල 2018 වර්ෂයට අදාල දත්තයන් ඉදිරිපත් කිරීමේදී සංශෝධනය කරන ලද සංඛ්‍යාවන් දක්වා තිබුණි. නමුත් එසේ සංශෝධනය කළ අගයන් කිහිපයකට අදාල විස්තර පමණක් ඒසීඒ 6 ආකෘතියේ පහතින් දක්වා තිබුණු අතර සංශෝධනය කරන ලද අනෙකුත් සංඛ්‍යාවන් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------------

6-1-1-0-2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම ප්‍රාග්ධන වැය විෂයය යටතේ වූ රු.500,000 ක මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම 6-1-1-1-2104 දරන ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමද, 6-1-1-0-1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂයෙහි මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම 6-1-1-0-1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා යන වැය විෂයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමද කර තිබුණි. තවද 6-1-1-0-1203 වැය විෂයයේ මුළු ප්‍රතිපාදනයෙන් 62% ක් 6-1-1-0-2003 දරන වැය විෂයය වෙත මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි පරිදි පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි **1647(ආ)** | වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් කොමිෂන් සභාව විසින් සිදුකර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| (i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.1.1 සිට 3.1.6 දක්වා වගන්ති | 2018 වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නිම කර අදාල සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඒ බව 2019 මාර්තු මස 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 අගෝස්තු 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. |
| (ii) 3.1.4 ඡේදය | සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියා මාර්ග ගැනීම සිදු කල යුතු නමුත් එම ඌනතා හා අතිරික්තතා සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(iii)** 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | 2019 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ

(i) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය — 2019 වර්ෂය අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ

4.2.1 ආකෘතිය — කොමිෂන් සභාව සකස් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ ආකෘතියේ මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රසම්පාදන වර්ගය පැහැදිලිව දක්වා නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එම්.ජී.බී.ජී.බී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.